**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 30 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු රු.6,458,795ක්වූ ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රාදේශීය සභාව සතු ප්‍රධාන කාර්යාල ගොඩනැගිලිවල අවසන් ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිලිවල වටිනාකම ඉඩම් හා ගොඩනැගිලිවල ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව අමුණා ඇත. | අදාළ පනතේ උපදෙස්වලට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල්ඉකුත් වූ තැන්පතුවල ඇතුළත් කර තිබූ කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු රඳවා ගැනීමේ තැන්පතු රු.246,504ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. | ආපසු ගෙවීමේ රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | <u>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය</u> අංක 2016/30 දරන 2016 දෙසැම්බර් 29දිනැති චක්‍රලේඛය | සභාව සතු වාහන 05 කට ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂාව නියමිත කාලයේදී සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව අන්තර්ජාල සේවාවන් ප්‍රජාවට නියමිත කාලයේ සලසා දීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, අදාල ඇතැම් ඉඩම් විකුණුම්වලින් 1%ක විකුණුම් බදු අයකළ යුතු වුවත්, සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභා බලප්‍රදේශයේ ඉඩම් කිසිවක් වෙන්දේසියේ නොවිකිණීම හේතුවෙන් බදු අයකිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. | විකුණුම් බදු අයකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව, අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 16,211,337ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,648,918 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,553,000 | 1,128,452 | 1,066,048 | 1,030,139 | 56,000 | 1,711,027 | 1,701,419 | 967,734 |
| කුලී | 6,571,600 | 5,732,588 | 5,737,838 | 2,619 | 6,273,000 | 6,885,830 | 6,881,230 | 7,870 |
| බලපත්‍ර ගාස්තු | 5,008,100 | 5,166,527 | 5,161,527 | 123,439 | 6,582,000 | 4,949,503 | 4,949,503 | 118,439 |
| වෙනත් ආදායම් | 72,301,500 | 53,737,353 | 51,799,019 | 10,082,972 | 71,094,172 | 78,923,997 | 45,358,962 | 35,452,178 |
| | 85,434,200 | 65,764,920 | 63,764,432 | 11,239,169 | 84,005,172 | 92,470,357 | 58,891,114 | 36,546,221 |

#### 2.2.2 වරිපනම් හා බදු

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ වරිපනම් බදු රු.1,030,139 ක් පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 05ක අධික කාලයක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හිඟ වරිපනම් බදු අයකිරීමට නියමිත කාලයේදි කටයුතු කළ යුතු වේ. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හිඟ බදුකුලි රු. 118,439 ක් සම්බන්ධයෙන් අයකිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හිඟ බදු කුලී අයකිරීමට නියමිත කාලයේදි කටයුතු කළ යුතු වේ. |

**2.2.4 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.1,386,081 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත. | හිඟ උසාවි දඩ මුදල් නියමිත කාලයේ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 8,288,414 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, මහජන සෞඛ්‍යය, උපයෝගී සේවාවන් සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුඛවිහරණය, පහසුකම් සහ සුභසාධනය ආදී සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, මූලික කරුණු 30ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 06ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ප්‍රාදේශීය සභා පනතට අනුකූලව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 22 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අදාල ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

(ඇ) ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 කාලපරිච්ඡේදයේ අවසන් කළ යුතු රු.20,670,000ක් වූ ක්‍රියාකාරකම් 18 ක් නියමිත කාලයේ අවසන් කර නොතිබුණි. | නියමිත කාලයේ අවසන් කිරීමට ඉදිරි කාලයේදි කටයුතු කරනු ලැබේ. | නියමිත කාලයේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට සභාව විසින් සුදුසු කටයුතු කළ යුතු වේ. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) ඝන අපද්‍රව්‍ය කාර්යයේ නිරතව සිටින සෞඛ්‍ය කම්කරුවන්ට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | වෛද්‍ය පරීක්ෂණයන් සිදු කරමින් පවතී. | කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් නියමිත කාලයේ සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී දිරන සහ නොදිරන ලෙස වර්ග නොකර රැස්කර තිබුණි. | වෙන් කර එකතු කිරීමට නියමිතයි. | ඝන අපද්‍රව්‍ය වෙන් කර රැස්කිරීමට කටයුතු කළ යුතුවේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත. | පරිසරය ආරක්ෂා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලයේ ගතයුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ලබාදී තිබූ ප්‍රජා මධ්‍යස්ථාන සහනාධාරවලින් රු.250,000ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත කාලයේ ලබාදිමට කටයුතු කරනු ලැබේ. | අදාල අවශ්‍යතා සඳහා නියමිත කාලයේ සහනාධාර උපයෝජනය සඳහා සභාව විසින් කටයුතු කළ යුතුවේ. |
| (ආ) | පළාත් පාලන සහකාර වරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රාදේශීය සභාවට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | නියමිත කාලයේ අදාල වාර්තා ඉදිරිපත් කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් විධිමත් අයුරින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 13 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාද වී තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලය තුළ පිරවීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපළ බදු අයකර ගැනීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපළහිමියන්ට “K” ආකෘති පත්‍ර බෙදාහැරිමට කටයුතු කළ යුතුවේ. එලෙස සඳහන් කර තිබුණත්, ප්‍රාදේශීය සභාව විසින් දේපළ සඳහා “K” ආකෘති පත්‍ර ජනතාවට බෙදාහැර නොතිබුණි. | දේපළ බදු අයකර ගැනීම සඳහා “K” ආකෘති පත්‍ර බෙදාහැරිමට කටයුතු කර ඇත. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුව “K” ආකෘති පත්‍ර බෙදාහැරිමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 09ක් අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් කිසිවක් ගෙන නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහන අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 07ක් ප්‍රාදේශීය සභාවේ නමට පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සභාව සතු වාහනවල අයිතිය පවරා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 3.5.3 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක කර්මාන්තය වෙනුවෙන් මනල්කාඩු වෙරළාසන්නයේ 2016 වර්ෂයේ රු.2,805,443ක පිරිවැයකින් ඉදිකර තිබූ වැසිකිළි පද්ධතිය, ඇඳුම් මාරු කිරීමේ කාමරය, වතුර ටැංකිය, කසළ බැහැර කිරීමේ ටැංකිය, වෙරළාසන්න ආසන, අලෙවි සැල් මේ දක්වා භාවිතා කර නොතිබූ අතර, නඩත්තු කරද නොතිබුණි. | එම ප්‍රදේශයේ ජනතාව ඒවා භාවිතය සඳහා කැමැත්තක් නොදක්වන අතර වක්‍රාකාරයෙන් විරෝධතාව හෙළකරති. | උක්ත සඳහන් කළ ගොඩනැගිලි කඩිනමින් භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවාවන් සඳහා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 හි සඳහන් ආකාරයට සෑම වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පදනම් වූ මූලික ලේඛන, යෝජනා, පළාත්පාලන ආයතනවල වර්ෂ 04ක සංවර්ධන යෝජනා වැඩසටහන්වල සඳහන් සේවාවන් ආදිය අනුගමනය කිරීමකින් තොරව සකස් කර තිබුණි. | මහජන සම්බන්ධීකරණ සංවර්ධන වැඩසටහන්, මහජන ඉල්ලීම් ආදිය පිළිබඳ සැලකිල්ලට ගනිමින් අයවැය සැලැස්මෙහි යෝජිත කාර්යයන් හා පළාත් නිෂ්චිත අරමුදලේ මූලධන කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ප්‍රකාරව කොන්ත්‍රාත් කාර්යයන් සම්බන්ධයෙන් සිදු කරන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර පිටපත් ජාතික විගණන කාර්යාලයට යවා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර නියමිත කාලයේදී ජාතික විගණන කාර්යාලයට යැවීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් පැවැතිම නිසා මෙම අයවැය ඵලදායි නොවූ අයවැයක් ලෙස නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |